# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

## 2005 අංක 27 දරන ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩල පනත

---

**[සහතිකය සටහන් කළේ 2005 සැප්තැම්බර් මස 15 වන දින]**

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී

---

2005 සැප්තැම්බර් මස 16 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 1, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකි ය.

මිල : රු.17.50 යි.    තැපැල් ගාස්තුව : රු.7.50 යි

# 2005 අංක 27 දරන ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩල පනත

[සහතිකය සටහන් කළේ 2005 සැප්තැම්බර් මස 15 වන දින]

එල්.ඩී.—ඕ. 31/2005.

**ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය පිහිටුවීම සඳහා ද ; 1978 අංක 19 දරන ශ්‍රී ලංකා මධ්‍යම ගමනාගමන මණ්ඩල පනත ඉවත් කිරීම සඳහා ද සහ 1991 අංක 37 දරන ජාතික ගමනාගමන කොමිෂන් සභා පනතට ආනුෂංගික සංශෝධන කිරීම සඳහා ද, ඊට සම්බන්ධ හෝ ආනුෂංගික කාරණා සඳහා ද විධිවිධාන සැලැස්වීම සඳහා වූ පනතකි.**

පූර්විකාව.

ලංකා ගමනාගමන මණ්ඩලය පිහිටුවනු ලැබූ 1957 අංක 48 දරන මෝටර් වාහන පනත 1978 අංක 19 දරන ශ්‍රී ලංකා මධ්‍යම ගමනාගමන මණ්ඩල පනත මගින් ඉවත් කරනු ලැබූ හෙයින් ද ; යට කී පනත මගින් ශ්‍රී ලංකා මධ්‍යම ගමනාගමන මණ්ඩලය සහ ප්‍රාදේශීය ගමනාගමන මණ්ඩල නවයක් පිහිටුවනු ලැබ එම මණ්ඩල වෙත ගමනාගමන සේවා සැපයීමේ කාර්යය පවරනු ලැබූ හෙයින් ද :

1987 අංක 23 දරන රාජ්‍ය සංස්ථා හෝ ආණ්ඩුවට අයත් ව්‍යාපාරික ආයතන පොදු සමාගම් බවට පරිවර්තනය කිරීමේ පනතේ 2 වන වගන්තිය ප්‍රකාරව ඇතැම් ප්‍රාදේශීය ගමනාගමන මණ්ඩල සමාගම් බවට පරිවර්තනය කිරීම මගින් පිහිටුවනු ලැබූ ජනතා සන්තක සමාගම් සහ ශ්‍රී ලංකා මධ්‍යම ගමනාගමන මණ්ඩලය මගින් සලසනු ලැබූ ගමනාගමන සේවා විධිමත් කිරීමේ කාර්ය භාරව සිටි ජාතික ගමනාගමන කොමිෂන් සභාව, 1991 අංක 37 දරන ජාතික ගමනාගමන කොමිෂන් සභා පනත මගින් පිහිටුවනු ලැබූ හෙයින් ද :

1996 අංක 30 දරන ජාතික ගමනාගමන කොමිෂන් සභා (සංශෝධන) පනත සම්මත වීමේ ප්‍රතිඵලයක් වශයෙන් ගමනාගමන සේවා සැපයීම සඳහා 1991 අංක 37 දරන ජාතික ගමනාගමන කොමිෂන් සභා පනතේ 46 (අ) වගන්තිය ප්‍රකාරව සීමාසහිත වවුනියා ජනතා සන්තක මගී ප්‍රවාහන සේවා සමාගම සහ ඒකාබද්ධ ජනතා සන්තක බස් සමාගම් පිහිටුවනු ලැබූ හෙයින් ද ; 1987 අංක 23 දරන රාජ්‍ය සංස්ථා හෝ ආණ්ඩුවට අයත් ව්‍යාපාරික ආයතන පොදු සමාගම් බවට පරිවර්තනය කිරීමේ පනතේ 2 වන වගන්තිය ප්‍රකාරව පිහිටුවනු ලැබූ නෝදන් ට්‍රාන්ස්පෝට් කම්පැනි ලිමිටඩ් සමාගම වෙත ප්‍රවාහන සේවා සැපයීමට බලය පවරනු ලැබූ හෙයින් ද :

ඉහත කී සමාගම්වල සියලුම වත්කම් සහ බැරකම් ද අයිතිවාසිකම් සහ වගකීම් ද මේ පනත මගින් පිහිටුවනු ලබන මෙම ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය වෙත පැවරීමට ද ඉහත කී පනත යටතේ පිහිටුවනු ලැබ පසුව පොදු සමාගම් බවට පරිවර්තනය කරනු නොලැබූ උතුරු ප්‍රාදේශීය ගමනාගමන මණ්ඩලය සහ වෙනත් ප්‍රාදේශීය ගමනාගමන මණ්ඩල විසුරුවා හැරීමත් 1978 අංක 19 දරන ගමනාගමන මණ්ඩල පනත යටතේ පිහිටුවන ලද ශ්‍රී ලංකා මධ්‍යම ගමනාගමන මණ්ඩලය විසුරුවා හැරීම සඳහා විධිවිධාන සැලැස්වීමටත් දැන් අවශ්‍ය වී ඇති හෙයින් ද :

1991 අංක 37 දරන ජාතික ගමනාගමන කොමිෂන් සභා පනතේ 46 (අ) වගන්තිය ප්‍රකාරව පිහිටුවනු ලැබූ සීමාසහිත වව්නියාව ජනතා සන්තක මගී ප්‍රවාහන සේවා සමාගම සහ ඒකාබද්ධ ජනතා සන්තක බස් සමාගම් සහ 1987 අංක 23 දරන රාජ්‍ය සංස්ථා හෝ ආණ්ඩුවට අයත් ව්‍යාපාරික ආයතන පොදු සමාගම් බවට පරිවර්තනය කිරීමේ පනතේ 2 වන වගන්තිය ප්‍රකාර පිහිටුවනු ලැබූ නෝදන් ට්‍රාන්ස්පෝට් කම්පැනි ලිමිටඩ් සමාගම ගණන් බේරා වසා දැමීම සඳහා පියවර ගැනීම අවශ්‍ය වී ඇති හෙයින් ද :

විවිධ සේවා සපයන සංවිධාන ඒකාබද්ධ කිරීම මගින් ගමනාගමන සේවා සඳහා දරන වියදම් ඵලදායී වීම සඳහා සහ කාර්යක්ෂම වීම සඳහා සහ එමගින් අදාළ සියලුම සේවා සැපයීම එක ඒකකයක් යටතේ මධ්‍යගත කිරීමට අවශ්‍ය වී ඇති හෙයින් ද :

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

ලුහුඬු නාමය සහ ක්‍රියාත්මක වීමේ දිනය.

**1**. මේ පනත 2005 අංක 27 දරන ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩල පනත යනුවෙන් හඳුන්වනු ලබන අතර, අමාත්‍යවරයා විසින් ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින් නියම කරනු ලබන (මෙහි මින් මතු "නියමිත දිනය" යනුවෙන් සඳහන් කරනු ලබන) දිනයක සිට ක්‍රියාත්මක විය යුතු ය.

## I වන කොටස

## ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය

ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය පිහිටුවීම.

**2**. (1) (මෙහි මින් මතු "මණ්ඩලය" යනුවෙන් සඳහන් කරනු ලබන) ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය යනුවෙන් හඳුන්වනු ලබන මණ්ඩලයක් පිහිටුවනු ලැබිය යුතු අතර, එම මණ්ඩලය පහත දැක්වෙන තැනැත්තන්ගෙන් සමන්විත විය යුතු ය :—

(අ) පහත දැක්වෙන නිල බලයෙන් පත් වන සාමාජිකයන් තිදෙනෙක් එනම් :—

(i) ප්‍රවාහන විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්වරයකුගේ නිලයට අඩුනොවන තත්ත්වයක නියෝජිතයකු ;

(ii) පලාත් සභා විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා ; සහ

(iii) භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම්වරයකු ; සහ

(ආ) ගමනාගමන, කළමනාකරණය, නීතිය, මූල්‍යය හෝ ඉංජිනේරු විද්‍යාව යන ක්ෂේත්‍රවල වෘත්තීය සුදුසුකම් ලත් තැනැත්තන් අතුරින් අමාත්‍යවරයා විසින් අධ්‍යක්ෂවරුන් වශයෙන් (මෙහි මින් මතු "පත්කළ සාමාජිකයන්" යනුවෙන් සඳහන් කරනු ලබන) සාමාජිකයන් හතරදෙනෙක්.

(2) අමාත්‍යවරයා විසින් මණ්ඩලයේ පත් කළ සාමාජිකයන් අතරින් යම් තැනැත්තකු මණ්ඩලයේ සභාපතිවරයා වශයෙන් පත් කරනු ලැබිය යුතු ය.

(3) පත් කරනු ලබන සෑම සාමාජිකයකුම කලින් ධුරය අත්හළහොත් හෝ ධුරයෙන් ඉවත් කරනු ලැබුවහොත් මිස, අවුරුදු තුනක කාලයක් සඳහා ධුර දැරිය යුතු ය. කාලය ඉකුත්වීම මගින් ධුරය අත්හරින පත් කළ සාමාජිකයකු නැවත පත් කිරීම සඳහා සුදුස්සකු වන්නේ ය.

(4) රෝගාතුරවීම, ශ්‍රී ලංකාවෙන් බැහැරව සිටීම හෝ වෙනත් යම් හේතුවක් නිසා පත්කළ සාමාජිකයකුට සිය ධුරයේ කටයුතු තාවකාලිකව ඉටු කිරීමට නොහැකි වන්නේ නම් අමාත්‍යවරයා විසින් ඔහු වෙනුවට සාමාජිකයකු වශයෙන් වෙනත් තැනැත්තකු පත් කරනු ලැබිය හැකි ය.

(5) යම් සාමාජිකයකුට අමාත්‍යවරයා අමතන ලිපියක් මගින් මණ්ඩලයෙන් ඉල්ලා අස්විය හැකි ය. අමාත්‍යවරයා විසින් අවශ්‍ය යයි සලකනු ලබන්නේ නම්, හේතු සඳහන් කරමින් යම් පත්කළ සාමාජිකයකු ධුරයෙන් ඉවත් කරනු ලැබිය හැකි ය.

මණ්ඩලයේ යම් රැස්වීමක් සඳහා ගණපූරණය සහ කාර්ය පටිපාටිය.

**3**. මණ්ඩලයේ යම් රැස්වීමක් සඳහා ගණපූරණය හතරදෙනකු විය යුතු ය. ගණපූරණය සංයුක්ත වන සාමාජිකයන් හතරදෙනාගෙන් එක් අයකු සෑමවිටම නිල බලයෙන් පත්වන සාමාජිකයකු විය යුතු ය. මේ පනතේ විධිවිධානවලට යටත්ව මණ්ඩලයේ රැස්වීම් සම්බන්ධයෙන් ද, එම රැස්වීම්වල කටයුතු සම්බන්ධයෙන් ද මණ්ඩලය විසින් සිය කාර්ය පටිපාටිය විධිමත් කළ හැකි ය.

මණ්ඩලයේ සාමාජිකයන් අතර පුරප්පාඩුවක් තිබීම මගින් මණ්ඩලයේ ක්‍රියා අවලංගු නොවිය යුතු බව.

**4**. මණ්ඩලයේ සාමාජිකයන් අතර යම් පුරප්පාඩුවක් හෝ එහි සාමාජිකයන්ගෙන් යම් සාමාජිකයකු පත්කිරීමෙහි ලා යම් දෝෂයක් තිබීමේ හේතුව නිසා ම පමණක් මණ්ඩලයේ යම් ක්‍රියාවක් හෝ කටයුත්තක් අවලංගු වන ලෙස සලකනු නොලැබිය යුතු ය.

මණ්ඩලයේ සාමාජිකයන්ගේ පාරිශ්‍රමික.

**5**. අමාත්‍යවරයා විසින් මුදල් විෂයය භාර අමාත්‍යවරයා විමසා තීරණය කරනු ලබන ආකාරයට සහ එවැනි අනුප්‍රමාණ අනුව මණ්ඩලයේ සාමාජිකයන්ට පාරිශ්‍රමික ගෙවනු ලැබිය යුතු ය.

මණ්ඩලයේ මුද්‍රාව.

**6**. (1) මණ්ඩලයේ පොදු මුද්‍රාව මණ්ඩලය විසින් කලින් කල තීරණය කරනු ලබන තැනැත්තකුගේ භාරයේ තිබිය යුතු ය.

(2) මණ්ඩලයේ මුද්‍රාව මණ්ඩලය විසින් කලින් කල තීරණය කරනු ලබන ආකාරයට වෙනස් කරනු ලැබිය හැකි ය.

(3) මණ්ඩලයේ මුද්‍රාව මණ්ඩලයේ නිල බලයෙන් පත්වන එක් සාමාජිකයකු ඇතුළු මණ්ඩලයේ සාමාජිකයන් දෙදෙනකු ඉදිරිපිට දී හැර කිසිම සාධන පත්‍රයකට හෝ ලේඛනයකට නොතැබිය යුතු ය. තමන් පැමිණ සිටි බවට සාක්ෂියක් වශයෙන් එම දෙදෙනාම එම සාධන පත්‍රයට හෝ ලේඛනයට අත්සන් තැබිය යුතු ය.

(4) මණ්ඩලයේ මුද්‍රාව තබනු ලැබූ සාධන පත්‍ර හෝ ලේඛන පිළිබඳ ලේඛනයක් මණ්ඩලය විසින් පවත්වාගෙන යා යුතු ය.

මණ්ඩලය වෙත අමාත්‍යවරයා විසින් කරනු ලබන විධාන.

**7**. (1) ස්වකීය බලතල ක්‍රියාත්මක කිරීමේ දී සහ කාර්ය සහ කර්තව්‍ය ඉටු කිරීමේ දී ජාතික යහපතට හෝ මණ්ඩලයේ කාර්යක්ෂම පරිපාලනයට බලපාන බවට තමාට පෙනී යන යම් කරුණකට අදාළව අමාත්‍යවරයා විසින් කලින් කල නිකුත් කරනු ලබන සාමාන්‍ය හෝ විශේෂ විධිවිධානවලට යටත්ව සහ ඒවාට අනුකූලව මණ්ඩලය ක්‍රියා කළ යුතු ය.

(2) අමාත්‍යවරයා විසින් නිශ්චිතව දක්වනු ලැබිය හැකි තැනැත්තා හෝ තැනැත්තන් විසින් මණ්ඩලයේ සියලුම හෝ යම් කටයුත්තක් විමර්ශනය කර වාර්තා කළ යුතු බවට අමාත්‍යවරයා විසින් කලින් කල එම තැනැත්තාට හෝ තැනැත්තන්ට නියම කරනු ලැබිය හැකි අතර එවැනි නියමයක් කිරීමේ දී එම නියමය ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය වන සියලු පහසුකම් මණ්ඩලය විසින් සැපයිය යුතු අතර එවැනි සියලු තොරතුරු මණ්ඩලය විසින් සැපයිය යුතු ය.

(3) අමාත්‍යවරයා විසින් වෙනත් යම් අමාත්‍යවරයකු වෙත පවරන ලද කර්තව්‍යවලට බලපාන යම් කරුණක් සම්බන්ධයෙන් (1) වන උප වගන්තිය යටතේ විධාන නිකුත් කිරීමේ දී අමාත්‍යවරයා එම අමාත්‍යවරයා සමග විමසා කටයුතු කළ යුතු ය.

මණ්ඩලය විසින් කාර්ය, කර්තව්‍ය සහ බලතල පැවරීම.

**8**. (1) 10 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (අ) සහ (ආ) ඡේදවල සහ 11 වගන්තියේ (1) වන උපවගන්තියේ (ආ), (ඒ), (ඔ) සහ (ඕ) යන ඡේදවල නිශ්චිතව දක්වා ඇති බලතල සහ කාර්ය හැර මණ්ඩලයේ සෙසු බලතල හෝ කාර්ය මණ්ඩලය විසින් එහි යම් සාමාජිකයකුට හෝ යම් සේවා නියුක්තයකුට පවරනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ යම් බලතල හෝ කාර්ය පවරනු ලැබූ සෑම තැනැත්තකු විසින් ම මණ්ඩලයේ සාමාන්‍ය හෝ විශේෂ අධීක්ෂණයට යටත්ව තමා වෙත පවරන ලද බලතල හෝ කාර්ය ක්‍රියාත්මක කිරීම හෝ ඉටු කිරීම කරනු ලැබිය යුතු ය.

**9**. (1) මේ පනතේ කාර්ය සඳහා උපදේශක කමිටුවක් පිහිටුවා තිබිය යුතු ය. මධ්‍යම උපදේශක කමිටුව.

(2) උපදේශක කමිටුව පහත දැක්වෙන තැනැත්තන්ගෙන් සමන්විත විය යුතු ය :—

(අ) මහා භාණ්ඩාගාරයේ ලේකම්වරයා විසින් නම් කරනු ලබන භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම්වරයකු ;

(ආ) ප්‍රවාහන විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ අතිරේක ලේකම්වරයකු ;

(ඇ) පහත සඳහන් අදාළ ආයතන මගින් නම් කරනු ලබන නියෝජිතයන් හතර දෙනෙකු :—

(i) ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනය ;

(ii) ලංකා වාණිජ මණ්ඩලය ;

(iii) ලොජිස්ටික් සහ ප්‍රවාහන වරලත් ආයතනය ;

(iv) ජාතික ප්‍රවාහන කොමිෂන් සභාව ; සහ

(ඈ) අමාත්‍යවරයා විසින් සේවා නියුක්තයන් විමසා පත් කරනු ලබන වෙනත් සාමාජිකයන් තිදෙනකු.

(3) උපදේශක කමිටුවේ කර්තව්‍ය පහත සඳහන් පරිදි විය යුතු ය :—

(අ) පත් කළ සාමාජිකයන්ගේ පත්කිරීම සහ ඉවත් කිරීම සම්බන්ධයෙන් ප්‍රවාහන විෂයය භාර අමාත්‍යවරයාට නිර්දේශ ඉදිරිපත් කිරීම ;

(ආ) 10 වන වගන්තියේ දක්වා ඇති වාර්ෂික සැලැස්ම ද ඇතුළුව මෙම පනතේ විධිවිධාන බලාත්මක කිරීම සඳහා අවශ්‍ය හෝ යෝග්‍ය වන්නේ යැයි අමාත්‍යවරයා හෝ මණ්ඩලය විසින් සලකනු ලබන මණ්ඩලයට යොමු කරනු ලබන සියලු කාරණා සම්බන්ධයෙන් මණ්ඩලයට උපදෙස් දීම ;

(ඇ) මණ්ඩලයේ කාර්යක්ෂම පරිපාලනය සඳහා අදාළ වන්නා වූ නිර්දේශ අමාත්‍යවරයා වෙත ඉදිරිපත් කිරීම.

(4) උපදේශක කමිටුව ස්වකීය කටයුතු නියාමනය කළ යුතු ය.

(5) උපදේශක කමිටුවේ යම් රැස්වීමක් සඳහා ගණපූරණය තිදෙනකු විය යුතු අතර, උපදේශක කමිටුව, එහි සභාපතිවරයා ලෙස එහි යම් සාමාජිකයකු තෝරා පත් කර ගත යුතු ය.

(6) ඉල්ලා අස්වීම, ඉවත් කිරීම හෝ මියයාම නිසා ධුරය හිස් කරන්නේ නම් මිස සෑම පත් කළ සාමාජිකයකු ම අවුරුදු තුනක කාලයක් සඳහා ධුර දැරිය යුතු ය. සිය ධුරකාලය අවසන් වීමෙන් ධුරය හිස් කරන උපදේශක කමිටුවට පත් කළ සාමාජිකයකු නැවත පත් කරනු ලැබීම සඳහා සුදුස්සකු විය යුතු ය.

(7) උපදේශක කමිටුවට පත් කළ සාමාජිකයකු අමාත්‍යවරයා අමතන ලිපියක් මගින් ධුරයෙන් ඉල්ලා අස්විය හැකි ය.

(8) රෝගාතුරවීම හෝ වෙනත් දුබලතාවයක් හෝ ශ්‍රී ලංකාවෙන් බැහැරව සිටීම හේතුවෙන් උපදේශක කමිටුවට පත් කළ යම් සාමාජිකයකු තාවකාලිකව සිය ධුරයේ කටයුතුවල නියැලීමට අපොහොසත් වන අවස්ථාවක, අමාත්‍යවරයා විසින් (2) වන උපවගන්තිය ප්‍රකාර ඒ වෙනුවට වෙනත් යම් තැනැත්තකු පත් කළ හැකි ය.

## II වන කොටස

## මණ්ඩලයේ කාර්ය සහ බලතල

මණ්ඩලයේ කාර්ය.

10. (1) පහත දැක්වෙන කාර්ය මණ්ඩලයේ කාර්ය විය යුතු ය :—

(අ) ජාතික ගමනාගමන කොමිෂන් සභාව සහ අදාළ පළාත් ප්‍රවාහන අධිකාරිය විමසා ආර්ථික ස්ථාවරත්වය ඇතිකරමින් කාර්යක්ෂම සහ ඵලදායී විධිමත් බස් සේවාවක් සැපයීම ;

(ආ) ඉහත සඳහන් අරමුණ සාක්ෂාත් කර ගැනීම සඳහා මණ්ඩලයේ යෝජනා ඇතුළත් කරමින් සහ ක්‍රියාත්මක කිරීම සිදු කළ යුතු ආකාරය හඳුනා ගනිමින් සහ විවිධ යෝජනා සඳහා වගකිව යුතු අදාළ පරදු තබන්නන් හඳුනා ගනිමින් සහ සම්පූර්ණ සැලැස්ම ක්‍රියාත්මක කිරීමේ දී ගතවීමට ඉඩ ඇති කාලසීමාව සඳහන් කරමින් මණ්ඩලය විසින් වාර්ෂික සැලැස්මක් පිළියෙල කළ යුතු ය. එම වාර්ෂික සැලැස්මට අදාළ වාර්ෂික අයවැයක් ද පිළියෙල කළ යුතු ය ;

(ඈ) මණ්ඩලයේ මෙහෙයුම් කටයුතුවල ප්‍රබලත්වය උපරිමයක් වන බවට සහතිකවීම සඳහා එම මෙහෙයුම් කටයුතු පවත්වාගෙන යා යුතු ආකාරයට මණ්ඩලයේ කටයුතු පවත්වාගෙන යාම ;

(ඇ) පොදු ප්‍රවාහන සේවයේ ගුණාත්මකභාවය වැඩිදියුණු වන ආකාරයට ප්‍රවාහන ක්ෂේත්‍රයේ වෙනත් යෝජනා ක්‍රම හෝ සේවා ක්‍රියාත්මක කිරීම.

(2) මණ්ඩලය අන්‍යාකාරයකට යටත් නොවන යම් අධිකරණයක් හෝ විනිශ්චය සභාවක් ඉදිරිපිට පැවැත්වෙන නීති කෘත්‍යයක් මගින් ක්‍රියාවේ යෙදවිය හැකි යම් ආකාරයක කාර්යයක් හෝ වගකීමක් කෙළින්ම හෝ වක්‍රව මණ්ඩලය වෙත පවරනු ලැබිය හැකි බවට මේ වගන්තියේ සඳහන් කිසිවක් තේරුම් නොගත යුතු ය.

11. (1) මණ්ඩලය විසින් පහත සඳහන් බලතල සියල්ල හෝ ඉන් යම් බලතලයක් ක්‍රියාත්මක කරනු ලැබිය හැකි ය :— මණ්ඩලයේ බලතල.

(අ) යම් නිශ්චල හෝ චංචල දේපලක් අත්කර ගැනීම, දැරීම, බද්දට හෝ කුලියට ලබාගැනීම හෝ දීම, උකස් කිරීම, ඔඩපනය කිරීම, විකිණීම හෝ අන්‍යාකාරයකින් බැහැර කිරීම ;

(ආ) මණ්ඩලයේ කටයුතු ඉටු කිරීම සඳහා අවශ්‍ය නිලධරයන් සහ සේවකයන් සේවයේ නියුක්ත කරවීම ;

(ඇ) මණ්ඩලය විසින් සේවයේ නියුක්ත කර ඇති තැනැත්තන්ගේ නිපුණත්වය වැඩිදියුණු කිරීමේ හෝ මණ්ඩලයේ උපකරණවල කාර්යක්ෂමතාවය වැඩිදියුණු කිරීමේ හෝ මණ්ඩලයේ කටයුතු ඉටු කිරීම සඳහා අවශ්‍ය පහසුකම් හෝ පුහුණු කිරීමේ තැනැත්තන් ඇතුළු මණ්ඩලයේ උපකරණ ක්‍රියාත්මක කරන ආකාරය වැඩිදියුණු කිරීමේ කාර්ය සඳහා යම් දෙයක් සිදු කිරීම ;

(ඈ) මණ්ඩලය විසින් සේවයේ නියුක්ත කරනු ලබන තැනැත්තන් සඳහා සුභසාධනය සහ ක්‍රීඩා පහසුකම්, නිවාස, නේවාසිකාගාර සහ වෙනත් නැවතීමේ පහසුකම් ලබාදීම ;

(ඉ) මණ්ඩලයේ ව්‍යාපාර කටයුතුවල කාර්ය සඳහා අවශ්‍ය වන උපකරණ නිර්මාණය කිරීම, නිෂ්පාදනය කිරීම, මිල දී ගැනීම, නඩත්තු කිරීම සහ අළුත්වැඩියා කිරීම ;

(ඊ) මණ්ඩලය විසින් ප්‍රවාහනය කරනු ලබන මගීන් සඳහා බස් නැවතුම් පලවල් හෝ ආවරණ සැපයීම ;

(උ) පුවත්පත්, තැපැල්, පාර්සල්, හෝ වෙනත් තැපැල් භාණ්ඩ මුදල් ගෙවීමේ පදනම මත රැගෙන යාමට භාර ගැනීම ;

(ඌ) ප්‍රායෝගික නොවන හෝ දුෂ්කර බවට මණ්ඩලය විසින් සලකනු ලබන මාර්ගවල කලින් කල බස් සේවා සැපයීමට උත්සාහ කිරීම ;

(එ) මණ්ඩලයට අයත් බස් රථ නවත්වන ස්ථාන සපයා දීම සහ නඩත්තු කිරීම ;

(ඒ) මණ්ඩලයේ කාර්ය ඉටු කිරීමේ දී සහ බලතල ක්‍රියාත්මක කිරීමේ දී අවශ්‍ය වන සියලුම ගිවිසුම්වලට ඇතුළත්ව ඒවා ක්‍රියාත්මක කිරීම ;

(ඔ) මණ්ඩලයේ පරිපාලන කටයුතු සම්බන්ධයෙන් රීති සෑදීම ; සහ

(ඕ) එහි කටයුතු නිසියාකාරයෙන් කරගෙන යාමට පහසුකම් සැලසීමට අවශ්‍ය යයි මණ්ඩලය විසින් අදහස් කරන වෙනත් සියලු දේ කිරීම.

මණ්ඩලයේ ගිණුම් නිලධරයා.

**12**. මණ්ඩලයේ සභාපතිවරයා, මණ්ඩලයේ ගිණුම් නිලධරයා විය යුතු ය.

ප්‍රධාන විධායක නිලධරයකු පත්කිරීම.

**13**. මණ්ඩලයේ ප්‍රධාන විධායක නිලධරයා විය යුතු මණ්ඩලයේ කටයුතු කළමනාකරණය පිළිබඳ වගකීමෙන් සහ මණ්ඩලයේ බලතල සහ කාර්යවලට අදාළ සහ එහිදී පැන නගින කාරණාවල දී නිසි පරිපාලනයෙන් යුතුව කටයුතු කරන පූර්ණකාලීන නිලධරයකු විය යුතු, තැනැත්තකු මණ්ඩලය විසින් පත් කරනු ලැබිය යුතු ය. මණ්ඩලය විසින් නිශ්චය කරනු ලැබිය හැකි පරිදි වූ යම් පාරිශ්‍රමික සහ වෙනත් වරප්‍රසාද ප්‍රධාන විධායක නිලධරයාට ලැබිය යුතු ය.

මණ්ඩලයේ කාර්ය මණ්ඩලයට රජයේ නිලධරයන් පත්කිරීම.

**14**. (1) මණ්ඩලයේ ඉල්ලීම පිට රාජ්‍ය සේවයේ යම් නිලධරයකු ඒ නිලධරයාගේ හා රාජ්‍ය පරිපාලන විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ කැමැත්ත ඇතිව සහ, එවැනිම කැමැත්ත ඇතිව මණ්ඩලය විසින් නිශ්චය කරනු ලැබිය හැකි යම් කාල පරිච්ඡේදයක් සඳහා මණ්ඩලයේ කාර්ය මණ්ඩලයට තාවකාලිකව පත් කරනු ලැබිය හැකි ය ; නැතහොත් එවැනිම කැමැත්ත ඇතිව ඒ කාර්ය මණ්ඩලයට ස්ථිර වශයෙන් පත්කරනු ලැබිය හැකි ය.

(2) රාජ්‍ය සේවයේ යම් නිලධරයකු මණ්ඩලයේ කාර්ය මණ්ඩලයට තාවකාලිකව පත් කරනු ලැබූ අවස්ථාවක, 1991 අංක 37 දරන ජාතික ගමනාගමන කොමිෂන් සභා පනතේ 14 වන වගන්තියේ (2) වන උපවගන්තියේ විධිවිධාන අවශ්‍ය වෙනස් කිරීම් සහිතව ඒ නිලධරයාට සහ ඒ නිලධරයා සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

(3) රාජ්‍ය සේවයේ යම් නිලධරයකු මණ්ඩලයේ කාර්ය මණ්ඩලයට ස්ථිර වශයෙන් පත් කරනු ලැබූ අවස්ථාවක, 1991 අංක 37 දරන ජාතික ගමනාගමන කොමිෂන් සභා පනතේ 14 වන වගන්තියේ (3) වන උපවගන්තියේ විධිවිධාන අවශ්‍ය වෙනස් කිරීම් සහිතව ඒ නිලධරයාට සහ ඒ නිලධරයා සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

(4) නිශ්චිත කාල සීමාවක් සඳහා ආණ්ඩුවට සේවය කිරීමට එකඟ වෙමින් ආණ්ඩුව සමඟ ගිවිසුමකට ඇතුළත් වූ යම් තැනැත්තකු මණ්ඩලය විසින් සේවයේ නියුක්ත කරනු ලැබූ අවස්ථාවක, ඒ තැනැත්තා විසින් මණ්ඩලයට සේවය කරනු ලබන යම් කාලසීමාවක්, ඒ ගිවිසුමේ බැඳීම් ඉටු කිරීමේ කාර්යය සඳහා ආණ්ඩුවට කරන ලද සේවයක් වශයෙන් සලකනු ලැබිය යුතු ය.

මණ්ඩලයේ නිලධරයන් සහ සේවකයන් රාජ්‍ය සේවකයන් ලෙස සලකනු ලැබිය යුතු ය.

**15**. දණ්ඩ නීති සංග්‍රහයේ අර්ථානුකූලව සහ කාර්ය සඳහා මණ්ඩලයේ සියලු නිලධරයන් සහ සේවකයන් රාජ්‍ය සේවකයන් ලෙස සලකනු ලැබිය යුතු ය.

අල්ලස් පනතේ අර්ථානුකූලව මණ්ඩලය උපලේඛනගත ආයතනයක් ලෙස සැලකිය යුතු බව.

**16**. අල්ලස් පනතේ සහ මේ පනතේ විධිවිධානවල අර්ථානුකූලව මණ්ඩලය උපලේඛනගත ආයතනයක් ලෙස සලකනු ලැබිය යුතු අතර ඒ අනුව තේරුම් ගනු ලැබිය යුතු ය.

මණ්ඩලය සඳහා ඉඩම් අත්කර ගැනීමේ පනත යටතේ නිශ්චල දේපල අත්කර ගැනීම.

**17**. (1) මණ්ඩලයේ කාර්ය සඳහා යම් නිශ්චල දේපළක් අත්කර ගැනීමට අවශ්‍ය වන්නා වූ ද, යෝජිත අත්කර ගැනීම ගැසට් පත්‍රයේ පළ කරන ලද නියමයක් මගින් අමාත්‍යවරයා විසින් අනුමත කරනු ලබන්නා වූ ද අවස්ථාවක, ඒ දේපළ මහජන කාර්යයක් සඳහා අවශ්‍ය යයි සලකනු ලැබිය යුතු අතර, ඒ අනුව ඒ දේපළ ඉඩම් අත්කර ගැනීමේ පනත යටතේ අත්කරගෙන මණ්ඩලය වෙත පවරනු ලැබිය හැකි ය.

(2) මණ්ඩලය සඳහා ඉඩම් අත්කර ගැනීමේ පනත යටතේ යම් නිශ්චල දේපළක් අත්කර ගැනීම සම්බන්ධයෙන් ගෙවිය යුතු යම් මුදලක් මණ්ඩලය විසින් ගෙවනු ලැබිය යුතු ය.

නිශ්චල හා චංචල රජයේ දේපල මණ්ඩලයට ලබාගත හැකිබව.

18. (1) මණ්ඩලයේ කාර්ය සඳහා රජයේ යම් නිශ්චල දේපළක් අවශ්‍ය වන අවස්ථාවක, ඒ කාර්යය රජයේ ඉඩම් ආඥාපනතේ 6 වන වගන්තිය යටතේ ඒ දේපළ සම්බන්ධ විශේෂ ප්‍රදානයක් හෝ බදුදීමක් හෝ කළ හැකි කාර්යයක් ලෙස සලකනු ලැබිය හැකි අතර, ඒ අනුව ඒ ආඥාපනතේ විධිවිධාන ඒ දේපළ මණ්ඩලයට විශේෂයෙන් ප්‍රදානය කිරීම හෝ බදුදීම සම්බන්ධයෙන් මණ්ඩලයට අදාළ විය යුතු ය.

(2) මණ්ඩලයේ කාර්යය සඳහා රජයේ චංචල දේපළක් අවශ්‍ය වන අවස්ථාවක ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින් අමාත්‍යවරයා විසින් ඒ චංචල දේපළෙහි සන්තකය හා පරිහරණය මණ්ඩලය වෙත පවරා සතු කරනු ලැබිය හැකි ය.

මුදල් ණයට ගැනීමට ආයතනය සතු බලතල.

19. (1) අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව හෝ, ඔහු විසින් දෙන ලද යම් පොදු බලයක නියමයන්ට අනුකූලව, අයිරා, අණකර වශයෙන් හෝ වෙනත් ආකාරයකින් හෝ එහි බැඳීම් ඉටුකිරීම සඳහා හෝ මණ්ඩලයේ කාර්ය ඉටුකිරීම සඳහා අවශ්‍ය මුදල් මණ්ඩලය විසින් තාවකාලිකව ණයට ගනු ලැබිය හැකි ය :

එසේ වුවද, මේ උපවගන්තිය යටතේ මණ්ඩලය විසින් තාවකාලිකව ගනු ලැබූ ණයවලින් ගෙවීම හිඟ තබා ඇති මුදලේ මුළු එකතුව, කිසිදු අවස්ථාවක අමාත්‍යවරයා විසින් මුදල් විෂයය භාර අමාත්‍යවරයා විමසා තීරණය කරනු ලබන යම් මුදල් ප්‍රමාණයකට වඩා වැඩි නොවිය යුතු ය.

(2) මුදල් විෂයය භාර අමාත්‍යවරයා විමසා අමාත්‍යවරයාගේ එකඟත්වය මත, පහත දැක්වෙන කාර්ය සියල්ල හෝ ඉන් කිසිවක් සඳහා (1) වන උපවගන්තිය යටතේ තාවකාලික ණය මාර්ගයකින් හැර අන්‍යාකාරයකින් මණ්ඩලය විසින් මුදල් ණයට ලබා ගත හැකි ය :—

(අ) වැඩ කිරීම සඳහා ප්‍රාග්ධනය සැපයීම ;

(ආ) ස්ථිර වැඩ කිසිවක් හෝ මුල් මුදලින් නිසිලෙස අයකර ගත හැකි වියදමක් වන්නා වූ වෙනත් දෙයක් සම්බන්ධයෙන් දරන ලද වියදම් කිසිවක් පියවීම සඳහා මුදල් සැපයීම ;

(ඇ) මණ්ඩලය විසින් මුදලින් ගෙවිය යුතු වන්නා වූ මේ පනත යටතේ වූ කිසියම් වන්දියක් ගෙවීමේ කාර්යය සඳහා අවශ්‍ය කරන මුදල් කිසිවක් සැපයීම ;

(ඈ) මණ්ඩලය විසින් ලබාගත් ණය කිසිවක් නිදහස් කිරීම ;

(ඉ) (1) වන උපවගන්තිය යටතේ තාවකාලිකව ණයට ලබාගත් මුදල් කිසිවක් නැවත ගෙවීම ඇතුළුව මුල් මුදල් නිසි ආකාරයෙන් අදාළ කරගත හැකි වන්නා වූ වෙනත් යම් කාර්යයක දී.

(3) මුදල් විෂයය භාර අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව මුදල් විෂයය භාර අමාත්‍යවරයා විමසා, මණ්ඩලය, අවස්ථානුකූලව සුදුසු යයි නිශ්චය කරන ලද පරිදි වූ කිසියම් ආකාරයකින් (1) වන උපවගන්තියේ සඳහන් කරන ලද අරමුණු කිසිවක් සඳහා මණ්ඩලය විසින් මුදල් ණයට ලබාගත හැකි ය.

**20**. මණ්ඩලයේ කටයුතුවල කාර්ය සඳහා වහා අවශ්‍ය නොවන මණ්ඩලයේ අරමුදල් කිසිවක් මණ්ඩලය සුදුසු යයි සිතන යම් ආකාරයකට ආයෝජනය කරනු ලැබිය හැකි ය. මණ්ඩලයේ අරමුදල් ආයෝජනය කිරීම.

## III වන කොටස

## මුදල්

**21**. (1) මණ්ඩලයේ කටයුතු කරගෙන යාමේ දී මූල්‍ය ස්ථාවරත්වය සහතික කිරීම පිණිස මණ්ඩලය විසින්— සංචිත.

(අ) මණ්ඩලයේ චංචල සහ නිශ්චල දේපල වැයවීම් ආවරණය කිරීමට වැයකිරීමේ සංචිතයක් ; සහ

(ආ) පොදු සංචිතයක්,

පිහිටුවා පවත්වාගෙන යා යුතු ය.

(2) (1) වන උපවගන්තියේ නිශ්චිතව සඳහන් කරන ලද එක් එක් සංචිත වෙනුවෙන් කලින් කලට කළ යුතු බැර කිරීම මණ්ඩලය විසින් නිශ්චය කරනු ලැබිය හැකි පරිදි විය යුතු ය.

(3) මණ්ඩලයේ සංචිතවල රැස් වූ මුදල් අදාළ කරගැනීම මණ්ඩලය විසින් නිශ්චය කරනු ලැබිය හැකි පරිදි විය යුතු ය.

මණ්ඩලයේ ආදායම් අදාළ කරගැනීම.

**22**. (1) මණ්ඩලයේ ආදායම පහත දැක්වෙන ගාස්තු දැරීමේ දී අදාළ කරගනු ලැබිය යුතු අතර මෙහි පහත දක්වා ඇති ආකාරයට මූලිකත්වය ලැබෙන පරිදි එසේ අදාළ කරගැනීම් කළ යුතු ය :—

(අ) වැය වීමේ සංචිතයකට අදාළ කරගනු ලැබිය හැකි, වෙන්කළ අවස්ථාවක් ඇතුළුව වැඩ කිරීමේ සහ ගොඩනැගීමේ වියදම්, මණ්ඩලයේ ආදායම් ගිණුමෙන් අයකරගනු ලැබිය හැකි බලතල සහ කාර්ය ඉටු කිරීම සහ ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් ;

(ආ) මණ්ඩලය විසින් ලබා ගන්නා ලද තාවකාලික ණය කිසිවක් මත වූ පොළිය ;

(ඇ) කිසියම් නිදන් අරමුදලකට හෝ බේරුම් අරමුදලකට පවරනු ලැබීමට අවශ්‍ය කරන මුදල් ; සහ

(ඈ) රජයේ ණය කිසිවක් මත වූ පොළිය සහ රජයේ කිසියම් ණය මුදලක මුල් මුදල ආපසු ගෙවීම සම්බන්ධයෙන් විය යුතු ය.

(2) (1) වන උපවගන්තියේ සඳහන් කරන ගාස්තුවලින් පසුව ඉතිරි වී ඇතැයි සැහීමට පත්ව ඇති කිසියම් වර්ෂයක් තුළ වූ මණ්ඩලයේ ආදායමේ අතිරික්තය මණ්ඩලයේ පොදු සංචිතයට වෙන් කරනු ලැබිය යුතු ය.

මුදල් වර්ෂය.

**23**. මණ්ඩලයේ මුදල් වර්ෂය, ලිත් වර්ෂය විය යුතු ය.

ගිණුම් විගණනය.

**24**. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 වන ව්‍යවස්ථාවේ විධිවිධාන මණ්ඩලයේ ගිණුම් විගණනය කිරීමට අදාළ විය යුතු ය.

1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන අදාළ කර ගැනීම.

**25**. මේ පනත මගින් විශේෂයෙන් අන්‍යාකාරයකින් විධිවිධාන සලසා ඇත්නම් මිස, 1971 අංක 38 දරන මුදල් පනතේ II වන කොටසේ විධිවිධාන අවශ්‍ය වෙනස් කිරීම් සහිතව මණ්ඩලයේ මුදල් පාලනය සහ ගිණුම් සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

## IV වන කොටස

## වැරදි

**26**. (1) මණ්ඩලයේ කිසියම් බස්රථයක දී,— වැරදි.

(අ) ඔහුගෙන් අයවිය යුතු ගාස්තු ගෙවීම පැහැර හරින ;

(ආ) ස්වකීය ගමනාන්තයට පැමිණි විට බස් රථයෙන්, කුලී මෝටර් රථයෙන් හෝ පාරුවෙන් බැස යාම හිතාමතාම ප්‍රතික්ෂේප කරන හෝ පැහැර හරින;

(ඇ) කිසියම් තැනැත්තකුට පීඩාකාරී හෝ අපහාස වන කිසියම් ආකාරයේ යම් අසභ්‍ය, අශෝභන හෝ ආවේගශීලී භාෂාවක් හෝ අභිනයක් හෝ හැසිරීමක් භාවිත කරන හෝ සිදු කරන ;

(ඈ) ඒ බස් රථයේ කිසියම් කොටසක් හිතාමතාම නාස්ති කර දමන ;

(ඉ) දුම්බීම තහනම් බවට දැන්වීමක් ප්‍රදර්ශනය කර තිබෙන්නා වූ යම් බස් රථයක කිසියම් කොටසක් තුළ හිඳ දුම්බීම සඳහා වූ කිසියම් දැල්වුනු දුම්කෝවක්, සුරුට්ටු, සිගරට් හෝ දුම්බොන යම් දෙයක් හෝ රැගෙන යන ; හෝ

(ඊ) පුද්ගලයන්ට හානියක් හෝ යම් තැනැත්තකුට හෝ දේපලකට හානියක් හෝ තුවාලයක් සිදු කිරීමට හැකි කිසියම් බෝතලයක්, දියරයක්, හෝ වෙනත් භාණ්ඩයක් හෝ දෙයක් එවැනි බස් රථයකින් පිටතට විසි කරන,

යම් මගියකු වරදකට වරදකරු විය යුතු අතර මහෙස්ත්‍රාත්වරයකු විසින් වරදකරු කරනු ලැබීමේ දී රුපියල් දෙසිය පනහකට නොඅඩු සහ රුපියල් දහසකට නොවැඩි දඩයකට යටත් විය යුතු ය :

එසේ වුව ද, තමාගෙන් අයවිය යුතු ගාස්තුව මෙන් දෙගුණයක් ඇතුළුව රුපියල් දෙසිය පනහක දඩයක් ඒ ගෙවීම ලබා ගැනීමට මණ්ඩලය විසින් බලය දෙන ලද මණ්ඩලයේ කිසියම් නිලධරයකුට ඒ තැනැත්තා විසින් ගෙවා ඇත්නම් (අ) ඡේදය යටතේ වූ වරදක් සම්බන්ධයෙන් කිසියම් තැනැත්තකුට එරෙහිව කිසිදු සිවිල් හෝ අපරාධ නඩු කටයුත්තක් පවරනු නොලැබිය යුතු ය.

(2) මණ්ඩලයේ කිසියම් බස්රථයක් තුල කිසියම් මගියෙක්—

(අ) ඒ ගමන්වාරය සඳහා තමාට නිකුත් කල ප්‍රවේශපත්‍රය ගමන මුළුල්ලේම දක්වා ඔහු සතුව රඳවා නොගන්නා ; හෝ

(ආ) ඒ බස්රථයේ කොන්දොස්තරවරයා විසින් හෝ තත්කාර්ය සඳහා මණ්ඩලය විසින් බලය දෙන ලද වෙනත් යම් තැනැත්තකු විසින් ඉල්ලා සිටි විට ඒ ප්‍රවේශපත්‍රය පෙන්වීම හෝ භාරදීම පැහැර හරින හෝ ප්‍රතික්ෂේප කරන,

යම් තැනැත්තකු වරදකට වරදකරු විය යුතු අතර මහෙස්ත්‍රාත්වරයකු විසින් වරදකරු කරනු ලැබීමේ දී රුපියල් දෙසිය පනහකට නොඅඩු සහ රුපියල් දහසකට නොවැඩි දඩයකට යටත් විය යුතු ය :

එසේ වුව ද, ඒ ගමන්වාරය සඳහා ඔහුගෙන් අයවිය යුතු ගාස්තුව මෙන්, දෙගුණයක් ඇතුළුව රුපියල් දෙසිය පනහක දඩයක් ඒ ගෙවීම ලබා ගැනීමට මණ්ඩලය විසින් බලය දෙන ලද මණ්ඩලයේ කිසියම් නිලධරයකුට ඒ තැනැත්තා විසින් ගෙවා ඇත්නම්, එවැනි යම් මගියකුට විරුද්ධව මේ උපවගන්තිය යටතේ වූ වරදක් සම්බන්ධයෙන් සිවිල් හෝ අපරාධ නඩු කටයුත්තක් පවරනු ලැබීම හෝ පවත්වාගෙන යනු ලැබීම නොකළ යුතු ය.

(3) (අ) මණ්ඩලයේ අවසරය මගින් හෝ ඒ යටතේ නිකුත් කරන ලද යම් ප්‍රවේශ පත්‍රයක් වංචා සහගත ලෙස පාවිච්චි කරනු ලබන හෝ ඒ සඳහා වෙනත් තැනැත්තකුට ඉඩ දෙනු ලබන ;

(ආ) එවැනි යම් ප්‍රවේශ පත්‍රයක් වංචා සහගත ලෙස අනුකරණය කරන, වෙනස් කරන, ස්වභාවය වෙනස් කරන, විකෘති කරන හෝ විනාශ කරනු ලබන ;

(ඇ) එවැනි යම් ප්‍රවේශ පත්‍රයක් මණ්ඩලයේ අවසරය නොමැතිව විකුණන, සපයන හෝ බෙදා හරින හෝ අලෙවිය සඳහා ඉදිරිපත් කරන හෝ සපයන හෝ බෙදාහරිනු ලබන ;

(ඈ) අවසරය නොමැතිව එවැනි ප්‍රවේශ පත්‍රයක් ලෙස මුද්‍රණය කරන ලදැයි අදහස් කරන හෝ පාවිච්චි කළ හැකි යම් ප්‍රවේශ පත්‍රයක් මුද්‍රණය කරන ;

(ඉ) මණ්ඩලයේ යම් බස් රථයක්, කුලී මෝටර් රථයක් හෝ පාරු සේවයක් හෝ එහි යම් උපකරණයක කොටසකට හිතාමතාම අලාභ සිදු කරන හෝ විකෘති කරන ;

(ඊ) එකී බස් රථයේ හෝ එහි උපකරණවල යම් කොටසක් සම්බන්ධයෙන් එම බස්රථයේ ක්‍රියාකාරීත්වයට බාධා කිරීම හෝ අනිසි ලෙස සම්බන්ධ වීම ලෙස ගණනය කරන ලද හෝ යම් තැනැත්තකුට තුවාල හෝ අපහසුතාවක් සිදු කරන දෙයක් හිතාමතාම සිදු කරන හෝ සිදු වීමට සලස්වන,

යම් තැනැත්තෙක් වරදකට වරදකරු විය යුතු අතර මහෙස්ත්‍රාත්වරයකු විසින් වරදකරු කරනු ලැබීමේ දී රුපියල් දෙසිය පනහකට නොඅඩු සහ රුපියල් දහසක් නොඉක්මවන දඩයකට හෝ මාස හයකට නොවැඩි කාලයක් සඳහා දෙආකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට හෝ ඒ දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දෙකටම හෝ ඔහු යටත් විය යුතු ය.

(4) මණ්ඩලයේ අවසරය නොමැතිව—

(අ) මණ්ඩලයට අයත් ප්‍රවේශ පත්‍ර නිකුත් කිරීම සඳහා යම් යන්ත්‍රයක් විවෘත කරන හෝ අන්‍යාකාරයකින් බලපෑම් කරන හෝ මැදිහත් වන ; හෝ

(ආ) මණ්ඩලය විසින් නිකුත් කරන යම් බිල්පත්‍ර හෝ රිසිට්පත්‍ර වෙනස් කිරීම හෝ ඒවාට අනිසි ලෙස මැදිහත් වන,

මණ්ඩලයේ යම් නිලධරයකු හෝ සේවකයකු වරදකට වරදකරු විය යුතු අතර මහෙස්ත්‍රාත්වරයකු විසින් වරදකරු කරනු ලැබීමේ දී රුපියල් දෙසිය පනහකට නොඅඩු සහ රුපියල් දහසකට නොවැඩි දඩයකට හෝ මාස හයක් නොඉක්මවන කාලයක් සඳහා බන්ධනාගාරගත කිරීමකට හෝ ඒ බන්ධනාගාරගත කිරීම හෝ දඩය යන දෙකටම හෝ ඔහු යටත් විය යුතු ය.

(5) මණ්ඩලය විසින් නිකුත් කරන ලද අවසර පත්‍රයක් තමාගේ සන්තකයේ තබා නොගෙන හෝ ටිකට් පතක් මිල දී නොගෙන යම් මණ්ඩලයේ බස්රථයකින්, කුලී මොටර් රථයකින් හෝ යම් පාරු සේවයකින් මගියකු වශයෙන් ගමන් කරනු ලබන යම් තැනැත්තකු වරදකට වරදකරු විය යුතු අතර මහෙස්ත්‍රාත්වරයකු විසින් වරදකරු කරනු ලැබීමේ දී රුපියල් දෙසිය පනහකට නොඅඩු සහ රුපියල් දහසකට නොවැඩි දඩයකට යටත් විය යුතු ය :

එසේ වුව ද, තත්කාර්ය සඳහා මණ්ඩලය විසින් බලය දෙන ලද යම් තැනැත්තකු වෙත එම තැනැත්තා විසින් ඔහුගෙන් අයවිය යුතු ගාස්තුව මෙන් දෙගුණයක් සමග රුපියල් දෙසීයක දඩමුදලක් ගෙවනු ලබන්නේ නම් කිසිම තැනැත්තකු විසින් මේ උපවගන්තිය යටතේ වූ වරදක් සම්බන්ධයෙන් කිසිම තැනැත්තකුට එරෙහිව කිසිම නඩුවක් පැවරීම හෝ පවත්වාගෙන යෑම නොකළ යුතු ය.

(6) මේ පනතේ හෝ නියෝගවල ප්‍රකාශිතව වෙනත් කිසිම දණ්ඩනයක් සඳහා විධිවිධාන සලස්වා නොමැති අවස්ථාවක මේ පනතේ විධිවිධාන හෝ ඒ යටතේ සාදන ලද නියෝගවලට එකඟව ක්‍රියා කිරීමට අපොහොසත් වන හෝ පැහැර හරින යම් තැනැත්තකු වරදකට වරදකරු විය යුතු අතර, මහෙස්ත්‍රාත්වරයකු විසින් එසේ වරදකරු කරනු ලැබීමේ දී රුපියල් පන්සියයකට නොඅඩු සහ රුපියල් එක් දහස් පන්සියයකට නොවැඩි දඩයකට හෝ මාස හයක් නොඉක්මවන කාලයකට දෙආකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට හෝ දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දෙකටම හෝ ඔහු යටත් විය යුතු ය.

(7) මේ පනත හෝ ඒ යටතේ සාදන ලද යම් නියෝගයක් යටතේ වරදක් සිදු කරන ලද බවට යම් තැනැත්තකුට එරෙහිව චෝදනා ඉදිරිපත් කරනු ලැබූ අවස්ථාවක දී, තමා ටිකට්පතක් මිලදී ගෙන ඇති බවට හෝ තමා සතුව වලංගු බලපත්‍රයක් ඇති බවට ඔප්පු කිරීමේ භාරය එම තැනැත්තා වෙත තිබිය යුතු ය.

(8) මේ පනත යටතේ හෝ ඒ යටතේ සාදන ලද නියෝග යටතේ යම් වරදක් සිදු කිරීමට තැත් කරන යම් තැනැත්තකු එම වරදට වරදකරු විය යුතු ය.

වරදකරුවන් අත්අඩංගුවට ගැනීම.

**27**. අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ පටහැනිව කුමක් සඳහන් වුව ද, මණ්ඩලයේ පරීක්ෂකවරයකුගේ නිලයට අඩු නොවන නිලයක යම් නිලධරයකු විසින් හෝ එකී නිලධරයා විසින් සිය සහායට කැඳවාගෙන එනු ලැබූ වෙනත් යම් තැනැත්තකු හෝ පොලිස් නිලධරයකු විසින් කිසිම වරෙන්තුවක් නොමැතිව හෝ කිසිම අවසරයක් නොමැතිව, 26 වන වගන්තිය යටතේ දඬුවම් ලැබිය යුතු වරදක් සිදු කරනු ලබන තැනැත්තකු නීත්‍යානුකූල ආකාරයට අත් අඩංගුවට ගනු ලැබිය හැකි අතර, එසේ අත් අඩංගුවට ගනු ලැබූ තැනැත්තා වහාම—

(අ) නීතියට අනුව ක්‍රියා කිරීම සඳහා මහෙස්ත්‍රාත්වරයකු ඉදිරියට ඉදිරිපත් කිරීම ; හෝ

(ආ) එසේ කිරීම ප්‍රායෝගික නොවන අවස්ථාවක දී, නීතියට අනුව ක්‍රියා කිරීම සඳහා ආසන්නතම පොලිස් ස්ථානයේ පොලිස් ස්ථානාධිපති වෙත භාර දීම,

කරනු ලැබිය යුතු ය :

එසේ වුව ද, ඩිපෝවේ හෝ මණ්ඩලයේ බස් නැවතුම්පලේ ස්ථාන භාර නිලධරයාගේ නිලයට අඩු නොවන නිලයක මණ්ඩලයේ නිලධරයකු විසින් එම තැනැත්තා පිළිබඳව ඇපයක් ඇතිව හෝ නොමැතිව ඇපකරයක් ලියා අත්සන් කිරීම මගින් ඒ තැනැත්තා මහෙස්ත්‍රාත් අධිකරණයේ පෙනී සිටීමට නියම කළහොත් හෝ එසේ කළවිට අධිකරණය ඉදිරියේ ඉදිරිපත් විය යුතු බවට විධාන කරමින් එම තැනැත්තා මුදා හරිනු ලැබිය හැකි ය.

## V වන කොටස

## සාමාන්‍ය

මණ්ඩලය සමග ගිවිසුම් වලට එළඹීම සඳහා සමාගම්වලට බලය ඇති බව.

**28**. එහි කාර්යවලට අදාළ යම් ලිඛිත නීතියක හෝ සාධන පත්‍රයක පටහැනිව කුමක් සඳහන් වුව ද යම් සමාගමක් හෝ පුද්ගල මණ්ඩලයක් විසින් මණ්ඩලය සමග, මණ්ඩලයේ කාර්ය ඉටු කිරීම සඳහා සහ බලතල ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය වන්නා වූ මගී ප්‍රවාහන කාර්යය පැවරීම හැර සියලු ගිවිසුම්වලට ඇතුළත් විය හැකි ය.

මේ පනත යටතේ හෝ මණ්ඩලයේ විධානය යටතේ ගන්නා ලද ක්‍රියාමාර්ග සඳහා ආරක්ෂාව.

**29**. (1) (අ) මණ්ඩලය විසින් මේ පනත යටතේ සද්භාවයෙන් කරන ලද හෝ කරන ලදැයි අදහස් කරන කිසිම ක්‍රියාවක් සඳහා මණ්ඩලයට එරෙහිව ; හෝ

(ආ) මේ පනත යටතේ හෝ මණ්ඩලයේ විධානය මත මණ්ඩලයේ යම් සාමාජිකයකුට, නිලධරයකුට, සේවකයකුට හෝ නියෝජිතයකුට එරෙහිව කරන ලද හෝ කරන ලදැයි අදහස් කරන යම් ක්‍රියාවකට එරෙහිව,

කිසිම සිවිල් හෝ අපරාධ නඩුවක් පවරනු නොලැබිය යුතු ය.

(2) මණ්ඩලයට එරෙහි ව වූ යම් සිවිල් හෝ අපරාධ නඩුවක දී මණ්ඩලය විසින් දරන ලද යම් වියදමක් මණ්ඩලයේ අරමුදලින් ගෙවනු ලැබිය යුතු ය. එවැනි සිවිල් හෝ අපරාධ නඩුවක දී මණ්ඩලයට ගෙවන ලද හෝ මණ්ඩලය විසින් අයකර ගනු ලබන යම් වියදමක් මණ්ඩලයේ අරමුදලට බැරකරනු ලැබිය යුතු ය.

(3) මේ පනත යටතේ හෝ මණ්ඩලයේ විධානය යටතේ යම් තැනැත්තකු විසින් කරන ලද හෝ කරන ලදැයි අදහස් කරන යම් ක්‍රියාවක් සම්බන්ධයෙන් අධිකරණය ඉදිරියේ තමාට එරෙහිව (1) වන උපවගන්තියේ (ආ) ඡේදයේ සඳහන් යම් සිවිල් හෝ අපරාධ නඩුවක දී තමා විසින් දරන ලද වියදමක්, එම කරන ලද හෝ කරන ලදැයි අදහස් කරන ක්‍රියාව ඔහු විසින් සද්භාවයෙන් කරන ලදැයි අධිකරණයේ මතය වන්නේ නම්, ඔහු විසින් එම වියදම ඒ සිවිල් හෝ අපරාධ නඩුවේ දී අයකරගෙන නැත්නම්, මණ්ඩලයේ අරමුදලින් ගෙවනු ලැබිය යුතු ය.

මණ්ඩලයේ සාමාජිකයකුට හෝ සාමාජිකයකුගේ දේපලකට එරෙහිව කිසිම රීට් ආඥාවක් නිකුත් නොකළ යුතු බව.

**30**. මණ්ඩලයට එරෙහිව වූ යම් නඩුවක දී මණ්ඩලයේ සාමාජිකයකුට එරෙහිව හෝ දේපලකට එරෙහිව කිසිම රීට් ආඥාවක් නිකුත් කරනු නොලැබිය යුතු ය.

නියෝග

**31**. (1) මේ පනතේ ප්‍රතිපත්ති සහ විධිවිධාන බලාත්මක කිරීම කරගෙන යාමේ කාර්ය සඳහා අමාත්‍යවරයා විසින් නියෝග සාදනු ලැබිය හැකි ය.

(2) විශේෂයෙන් ම සහ (1) වන උපවගන්තියේ සඳහන් බලතලවල ව්‍යාප්තියට හානියක් නොමැතිව අමාත්‍යවරයා විසින් පහත දැක්වෙන කාරණ සම්බන්ධයෙන් නියෝග සාදනු ලැබිය හැකි ය:—

(අ) මේ පනත මගින් සාදනු ලැබිය යුතු බවට බලය දී ඇති හෝ නියමකර ඇති නියෝග සැදිය යුතු කාරණ සම්බන්ධයෙන්;

(ආ) අවම සුදුසුකම් ද ඇතුළුව විවිධ තත්ත්වයන් සඳහා නිලධරයන් සහ සේවා නියුක්තයන් බඳවා ගැනීම සඳහා වූ මාර්ගෝපදේශ සහ කාර්ය පටිපාටිය;

(ඇ) වාර්ෂික අයවැය ලේඛනයේ සහ වාර්ෂික ඒකාබද්ධ සැලසුමේ ඇතුළත් කළ යුතු කාරණ ;

(ඈ) වත්කම් අත්කර ගැනීම සහ බැහැර කිරීම සඳහා වූ මාර්ගෝපදේශ සහ කාර්ය පටිපාටිය.

(3) අමාත්‍යවරයා විසින් සාදනු ලබන සෑම නියෝගයක් ම ගැසට් පත්‍රයේ පළකරනු ලැබිය යුතු අතර එම ගැසට් පත්‍රයේ පළ කළ දින සිට හෝ නියෝගයේ නිශ්චිතව දක්වනු ලැබිය හැකි පසු දිනයක සිට ක්‍රියාත්මක විය යුතු ය.

(4) අමාත්‍යවරයා විසින් සාදනු ලබන සෑම නියෝගයක් ම ගැසට් පත්‍රයේ පළ කළ පසු හැකි පහසු ඉක්මණින් අනුමතය සඳහා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ යුතු ය. එසේ අනුමත නොවූ සෑම නියෝගයක් ම එම අනනුමතයේ දින සිට පරිච්ඡින්න වූ ලෙස සලකනු ලැබිය යුතු නමුත්, ඒ යටතේ කලින් කරන ලද කිසිවකට ඉන් අගතියක් නොවිය යුතු ය.

(5) යම් නියෝගයක් පරිච්ඡින්න වූ ලෙස සලකනු ලබන දිනය පිළිබඳව නිවේදනය ගැසට් පත්‍රයේ පළකරනු ලැබිය යුතු ය.

## VI වන කොටස

## ඉවත් කිරීම සහ අන්තර්කාලීන

ඉවත් කිරීම.

**32**. 1978 අංක 19 දරන ශ්‍රී ලංකා ප්‍රවාහන මණ්ඩල පනත මෙයින් ඉවත් කරනු ලැබේ.

මණ්ඩලයේ සේවා නියුක්තයන්, දේපල, ගිවිසුම්, අයිතිවාසිකම්, බැඳීම් සහ වගකීම් වලට අදාළ වන සහ මණ්ඩලය විසින් හෝ එයට එරෙහිව පවරා ඇති සහ පවතින නඩු සහ ඉල්ලීම්වලට අදාළ සහ මණ්ඩලයේ වාසියට හෝ එයට එරෙහිව පනවා ඇති ඉටුකරනු නොලැබූ තීන්දු ප්‍රකාශ හෝ ප්‍රදාන.

**33**. නියමිත දිනයේ දී,—

(1) එම දිනයට පෙරාතුව ම වූ දිනයේ දී ශ්‍රී ලංකා මධ්‍යම ප්‍රවාහන මණ්ඩලයේ, උතුරු පළාත් ප්‍රවාහන මණ්ඩලයේ, ප්‍රාදේශීය ප්‍රවාහන මණ්ඩලයේ, සීමාසහිත වච්නියාව ජනතා සන්තක මගී ප්‍රවාහන සේවය, ඒකාබද්ධ ජනතා සන්තක බස් සමාගම්වල සහ සීමාසහිත උතුරු ප්‍රවාහන සමාගමේ සේවයේ නියුක්ත සියලු නිලධරයන් වෙනත් සේවා නියුක්තයන්, ඔවුන්ගේ අදාළ ආයතන යටතේ වූ සේවා නියුක්තියට සම්බන්ධ නියම සහ කොන්දේසිවලට වඩා වාසිදායක භාවයෙන් අඩු නොවන්නා වූ නියම හා කොන්දේසිවලට යටත්ව මණ්ඩල සේවාවේ සේවා නියුක්තයන් ලෙස සලකනු ලැබිය යුතු ය. එම සේවා නියුක්තයන්ගේ සේවය ඔවුන්ගේ සේවා නියුක්තිය පිළිබඳව කොන්දේසි අනුව හෝ ස්වේච්ඡාවෙන් විශ්‍රාම යෑමේ යෝජනා ක්‍රමයක් හරහා හෝ විනයානුකූල හේතු මත හැර වෙනත් ආකාරයකට අවසන් කරනු නොලැබිය යුතු ය.

(2) (අදාළ ආයතනවල අරමුදල්වල වූ මුදල් ද ඇතුලුව) එම දිනයට පෙරාතුව ම වූ දිනයේ දී, ශ්‍රී ලංකා මධ්‍යම ගමනාගමන මණ්ඩලයේ, උතුරු පළාත් ප්‍රවාහන මණ්ඩලයේ, ප්‍රාදේශීය ප්‍රවාහන මණ්ඩලවල, සීමාසහිත වච්නියාව ජනතා සන්තක මගී ප්‍රවාහන සේවාවේ, ඒකාබද්ධ ජනතාසන්තක බස් සමාගමේ සහ සීමාසහිත උතුරු ප්‍රවාහන සමාගමේ සියලු නිශ්චල සහ චංචල දේපල මණ්ඩලය වෙත සතු කළ යුතු අතර, මණ්ඩලයේ දේපලක් විය යුතු ය.

(3) සීමාසහිත වව්නියා ජනතාසන්තක මගී ප්‍රවාහන සමාගම, ඒකාබද්ධ ජනතාසන්තක බස් සමාගම් සහ සීමාසහිත උතුරු ප්‍රවාහන සමාගම යන සමාගම් විසින් කිසිදු ප්‍රතිෂ්ඨාවක් නොලබා තම සේවා නියුක්තයන්ට හෝ කලින් සිටි සේවා නියුක්තයන්ට නිකුත් කරනු ලැබුවා වූ ද නියමිත දිනයට පෙරාතුව වූ දිනයේ දී ඔවුන් විසින් දරනු ලැබුවා වූ ද සියලුම කොටස් මේ පනතේ, 2 වන වගන්තිය මගින් පිහිටුවනු ලබන ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය වෙත සතුවී ඒවා එම ගමනාගමන මණ්ඩලයේ දේපලක් විය යුතු අතර, එම කොටස්වල මිල දැනට සම වටිනාකමට වඩා අඩු වුවද එය නොතකා ඒ එක් එක් කොටස සම්බන්ධයෙන් එම සේවා නියුක්තයන්ට සහ කලින් සිටි සේවා නියුක්තයන්ට හෝ එම කොටස් දරන වෙනත් තැනැත්තන්ට වන්දි මුදල් ගෙවනු ලැබිය යුතු ය.

(4) එම දිනයට පෙරාතුව වූ දිනයේ දීම බලාත්මකව පවතින ශ්‍රී ලංකා මධ්‍යම ගමනාගමන මණ්ඩලයේ, ප්‍රාදේශීය ගමනාගමන මණ්ඩලවල සීමාසහිත වව්නියා ජනතාසන්තක මගී ප්‍රවාහන සේවා සමාගමේ, ඒකාබද්ධ ජනතාසන්තක බස් සමාගම්වල සහ සීමාසහිත උතුරු ප්‍රවාහන සමාගමේ සියලු කොන්ත්‍රාත් සහ ගිවිසුම් මණ්ඩලයේ කොන්ත්‍රාත් සහ ගිවිසුම් ලෙස සලකනු ලැබිය යුතු අතර, එම කොන්ත්‍රාත් සහ ගිවිසුම් යටතේ එම අස්තිත්වයේ අයිතිවාසිකම්, සේවක අර්ථසාධක අරමුදල්, සේවක භාරකාර අරමුදල් සහ පාරිතෝෂික සම්බන්ධ බැඳීම් ද ඇතුළු බැඳීම් සහ වගකීම් ලෙස සලකනු ලැබිය යුතු ය.

(5) එම දිනයට පෙරාතුවම වූ දිනයේ දී යම් අධිකරණයක හෝ විනිශ්චය අධිකාරියක ශ්‍රී ලංකා මධ්‍යම ගමනාගමන මණ්ඩලය, ප්‍රාදේශීය ගමනාගමන මණ්ඩලය, සීමාසහිත වව්නියා ජනතාසන්තක මගී ප්‍රවාහන සේවා සමාගම, ඒකාබද්ධ ජනතා සන්තක බස් සමාගම් සහ සීමාසහිත උතුරු ප්‍රවාහන සමාගම යන ආයතන විසින් හෝ එම ආයතනවලට විරුද්ධව පවරා ඇති හෝ ඉදිරිපත් කර ඇති යම් නඩුවක්, ඉල්ලීමක් හෝ අභියාචනයක් මණ්ඩලය විසින් හෝ එයට විරුද්ධව පවරා ඇති හෝ ඉදිරිපත් කරන ලද නඩුවක්, ඉල්ලීමක් හෝ අභියාචනයක් ලෙස සලකනු ලැබිය යුතු ය.

(6) එම දිනයට පෙරාතුව ම වූ දිනයේ දී ශ්‍රී ලංකා මධ්‍යම ගමනාගමන මණ්ඩලය, ප්‍රාදේශීය ගමනාගමන මණ්ඩලය, සීමාසහිත වව්නියා ජනතා සන්තක මගී ප්‍රවාහන සේවා සමාගම, ඒකාබද්ධ ජනතාසන්තක බස් සමාගම් සහ සීමාසහිත උතුරු ප්‍රවාහන සමාගම යන ආයතන විසින් හෝ ඒවාට එරෙහිව පවරා ඇති හෝ ඉදිරිපත් කර ඇති යම් නඩුවක දී, ඉල්ලීමක දී හෝ අභියාචනයක දී අධිකරණයක් හෝ විනිශ්චය

අධිකාරියක් විසින් වාර්තාගත කොට ඇති හෝ ප්‍රදානය කරනු ලැබ, නියමිත දිනයට පෙරාතුව ම වූ දිනයේ දී එය සම්පූර්ණයෙන්ම හෝ කොටසක් ඉටුකර නොමැතිව ඉතිරිව පවතින යම් තීන්දු ප්‍රකාශයක් හෝ ප්‍රදානයක් අවස්ථාවෝචිත පරිදි, මණ්ඩලයේ වාසියට හෝ එයට එරෙහිව වාර්තාගත කොට ඇති හෝ ප්‍රදානය කරන ලද තීන්දු ප්‍රකාශයක් හෝ ප්‍රදානයක් ලෙස සලකනු ලැබිය යුතු අතර, සිවිල් නඩු විධාන සංග්‍රහයේ විධිවිධානවලට හෝ තීන්දු ප්‍රකාශයක් හෝ ප්‍රදානයක් ක්‍රියාවේ යෙදවීමට අදාළ වෙනත් යම් ප්‍රඥප්තියකට යටත්ව මණ්ඩලය විසින් හෝ එයට එරෙහිව ක්‍රියාවේ යෙදිය හැකි ය.

**34**. මේ පනතේ සිංහල හා දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බල පැවැත්විය යුතු ය.

අනනුකූලතාවක් ඇතිවූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

**35**. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍යවුවහොත් මිස මේ පනතේ—

අර්ථ නිරූපනය.

“ පොදු කාල සටහන” යන්නෙන්, යම් තෝරාගත් මාර්ගයක සියලුම බස් ක්‍රියාත්මක වන කාල සටහන එක් සටහනකින් පෙන්නුම් කරන කාලසටහනක් අදහස් වේ ;

“නිශ්චල දේපල” යන්නෙන්, ඉඩම් අදහස් වන අතර, ඊට ජලයෙන් යටවූ ඉඩම් ද, නිවාස, ගොඩනැගිලි සහ නිවාසවල සහ ගොඩනැගිලිවල කොටස් ද ඇතුළත් වේ ; සහ

“බස්රථය” යන්නට මෝටර් ප්‍රවාහන පනතේ ඇති අර්ථයම තිබිය යුතු ය.

## VII වන කොටස

## 1991 අංක 37 දරන ජාතික ගමනාගමන කොමිෂන් සභා පනතට කරනු ලබන සංශෝධන

**36**. (මෙහි මින් මතු මේ කොටසෙහි “ප්‍රධාන ප්‍රඥප්තිය” යනුවෙන් සඳහන් කරනු ලබන) 1991 අංක 37 දරන ජාතික ගමනාගමන කොමිෂන් සභා පනතේ පූර්විකාව පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

1991 අංක 37 දරන පනතේ පූර්විකාවට කරනු ලබන සංශෝධන.

(1) (අ) ඡේදය ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන ඡේදය ආදේශ කිරීමෙන් :—

"(අ) විද්‍යාත්මකව තීරණය කරනු ලබන පොදු කාලසටහනක් මත ඇත්ත වශයෙන් වූ මගී ඉල්ලීම් සපුරාලීම සඳහා ප්‍රවීන රාජ්‍ය බස් සේවයක් හෝ පෞද්ගලික බස් සේවයක් ලබා ගැනීම";

(2) එහි (ඇ) ඡේදයේ "ලාභ නොලබන ගමන් මාර්ග" යන වචන වෙනුවට "ලාභ නොලබන ගමන් මාර්ග සේවා සහ ගමන් වාර" යන වචන ආදේශ කිරීමෙන් ;

(3) (ඈ) ඡේදය ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන ඡේදය ආදේශ කිරීමෙන් :—

"(ඈ) එම සෙවා සපයන්නන් අතර යහපත් තරගයක් ඇතිකර අසාධාරණ සහ ලාභ නොලබන තරඟකාරීත්වය වැළැක්වීම";

(4) (ඈ) ඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් ඡේදය එකතු කිරීමෙන් :—

"(ඉ) මහජනතාවට බස්වලින් ආරක්ෂා සහිත සහ සැපපහසු ප්‍රවාහන සේවයක් සපයන බවට සහතික වීම සඳහා".

ප්‍රධාන ප්‍රඥප්තියේ 18 වන වගන්තිය ඉවත් කිරීම සහ ආදේශ කිරීම.

**37**. ප්‍රධාන ප්‍රඥප්තියේ 18 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර ඒ වෙනුවට පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ :—

"මගී සේවා අවසර පත්‍ර ප්‍රදානය කිරීමේ දී ලියාපදිංචි කිරීම.

18. (1) කොමිෂන් සභාව විසින් හෝ එය වෙනුවෙන් බලය පවරනු ලබන තැනැත්තකු විසින් නිකුත් කරන ලද සහ තත්කාලයේ බල පවත්නා මගී සේවා අවසර පත්‍රයක අධිකාරය යටතේ හැර ගාස්තුවක් හෝ ත්‍යාගයක් හෝ වෙන් වශයෙන් වූ ගාස්තුවක් සඳහා මගීන් ප්‍රවාහනය කිරීම සඳහා කිසිම තැනැත්තකු විසින් බස් රථයක් පාවිච්චි නොකළ යුතු ය.

(2) මේ වගන්තියේ කාර්ය සඳහා පළාත් දෙකක් හෝ ඊට වැඩි ගණනක් අතර මගීන් ප්‍රවාහනය කිරීම සඳහා බස්රථ යෙදවීම සඳහා අවසර පත්‍රයක් නිකුත් කිරීමේ බලය කොමිෂන් සභාව වෙත පවරනු ලබන්නේ ය.".

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 870 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 32, ට්‍රාන්ස්වර්ක්ස් මන්දිරය, ලෝටස් පාර, කොළඹ 01, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.